# සතිපතා ආර්ථික දර්ශක



2024 මැයි 03


සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2024 මාර්තු මාසයේ වාර්තා වූ සියයට 0.9හි සිට 2024 අප්‍රේල් මාසයේ දී සියයට 1.5ක් වාර්තා කරමින් ඉහළ යෑමක් පෙන්නුම් කළේය. 2024 අප්‍රේල් මාසයේ දී ආහාර කාණ්ඩය සියයට 2.9ක උද්ධමනයක් වාර්තා කළ අතර, ආහාර නොවන කාණ්ඩය සියයට 0.9ක උද්ධමනයක් වාර්තා කළේය. තවද, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2024 මාර්තු මාසයේ පැවති සියයට 3.1හි සිට 2024 අප්‍රේල් මාසයේ දී සියයට 3.4 දක්වා ඉහළ ගියේය.

2024 මාර්තු මාසයේ දී, ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ලෙස හඳුන්වනු ලබන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය මගින් පෙර මාසයට සාපේක්ෂව ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.

සලකා බලන කාලපරිච්ඡේදය (2024.04.27 සිට 2024.05.03 දක්වා කාලය) තුළ දී, ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර සටන් විරාම ගිවිසුමක් ක්‍රියාවට නැංවිය හැකි බවට අපේක්ෂා වර්ධනය වීම සහ එක්සත් ජනපද ආර්ථිකයේ ගමන් මග පිළිබඳ පවතින අවිනිශ්චිතතා හේතුවෙන් ප්‍රධාන වශයෙන් බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේ ය. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල ගණන්, පිළිවෙළින් එ.ජ.ඩොලර් 4.76කින් සහ එ.ජ.ඩොලර් 3.91කින් පහළ ගියේ ය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2024 මාර්තු මස 03 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 2කින් සියයට 10.15ක් දක්වා ඉහළ ගියේය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය පහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් පහළ යන ලදී.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අඟ පැවති රුපියල් බිලියන 109.288ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 120.028ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2024 මැයි මස 03 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 1.67 කින් දර්ශක අගය 12,404.33 ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 1.03 කින් දර්ශක අගය 3,672.05 ක් දක්වා ඉහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

2023 වසර තුළ දී රාජ්‍ය ආදායම සහ ප්‍රදාන, 2022 වසරේ දී වාර්තා වූ රු. බිලියන 2,012.59ට සාපේක්ෂව, රු. බිලියන 3,074.32ක් දක්වා ඉහළ ගියේය.

සමස්ත වියදම සහ ශුද්ධ ණය දීම්, 2022 වසරේ දී වාර්තා වූ රු. බිලියන 4,472.56ට සාපේක්ෂව, 2023 වසර අවසානයේ දී රු. බිලියන 5,356.59ක් දක්වා ඉහළ ගියේය.

2023 වසර තුළ දී සමස්ත අයවැය හිඟය, 2022 වසරේ දී වාර්තා වූ රු. බිලියන 2,459.97ට සාපේක්ෂව, රු. බිලියන 2,282.27ක් දක්වා අඩු විය.

ශුද්ධ දේශීය මූල්‍යනය, 2022 වසර තුළ දී පැවති රු. බිලියන 2,035.15ට සාපේක්ෂව, 2023 වසරේ දී රු. බිලියන 1,787.61ක් දක්වා පහළ ගියේය. ශුද්ධ විදේශීය මූල්‍යනය, 2022 වසර තුළ දී වාර්තා වූ රු. බිලියන 424.82ක ශුද්ධ විදේශීය මූල්‍යනයට සාපේක්ෂව, 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 494.66ක් ලෙස වාර්තා විය.

මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2022 වසර අවසානයේ දී පැවති රු. බිලියන 27,492.03 සිට 2023 වසර අවසාන වන විට රු. බිලියන 28,695.95ක් දක්වා වැඩි විය. 2023 වසර අවසාන වන විට සමස්ත නොපියවූ දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 17,051.85ක් වූ අතර සමස්ත නොපියවූ විදේශීය ණය ප්‍රමාණය රු. බිලියන 11,644.09ක් විය.

මෙම සතිය තුළ දී, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික පහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 1 ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය පිළිවෙළින් ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් දෙගුණයක් සහ තුන්ගුණයකි.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 18 ක ප්‍රතිශතයකින් ඉහළ යාමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය

2024 වසරේ මැයි 03 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 9.1කින් අතිප්‍රමාණය විය.

2024 වසරේ මාර්තු මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 4,960ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් මෙහි අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

2024 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,169ක් දක්වා සියයට 5.7කින් ඉහළ ගිය අතර, මේ සඳහා අපනයන කාණ්ඩ අතරින් ඛනිජ තෙල් නිෂ්පාදිත (107.1%), තේ (12.9%), ආහාර, පාන වර්ග හා දුම්කොළ (29.7%) සහ රබර් නිෂ්පාදිත (12.4%) අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,398ක් දක්වා සියයට 12.9කින් ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ (28.0%), මූල ලෝහ (175.6%), ඉන්ධන (5.2%) සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග (8.9%) ආනයන ඉහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2024 වසරේ මාර්තු මාසයෙන් අවසාන වන මාස තුන තුළ දී වෙළඳ හිඟය, 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 896ක සිට එ.ජ. ඩොලර් මිලියන 1,229ක් දක්වා පුළුල් විය.

කාර්මික සහ කෘෂිකාර්මික භාණ්ඩ අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2024 වසරේ මාර්තු මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 8.3කින් පහළ ගියේය. 2024 වසරේ මාර්තු මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.4කින් පහළ ගිය අතර, මේ සඳහා අන්තර් සහ පාරිභෝගික භාණ්ඩ ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය. මේ අනුව, 2024 වසරේ මාර්තු මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 84.4ක් දක්වා සියයට 3.4කින් ඉහළ ගියේය.

තේ සඳහා වෙන්දේසි මිලෙහි සාමාන්‍යය (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2023 වසරේ මාර්තු මාසයේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.85ක සිට 2024 වසරේ මාර්තු මාසයේ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 4.32ක් දක්වා ඉහළ ගියේය. මේ අතර 2023 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් සඳහා පැවති ආනයන මිලෙහි සාමාන්‍යය වූ බැරලයකට එ.ජ. ඩොලර් 84.05ක සිට 2024 වසරේ මාර්තු මාසයේ දී, බැරලයකට එ.ජ. ඩොලර් 82.76ක් දක්වා පහළ ගියේය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2023 | 2024 | |
|---|---|---|---|
| | මාර්තු | පෙබ. | මාර්තු |
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 204.8 | 214.5 | 210.0 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.3 | (0.2) | (2.1) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 10.2 | 7.2 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 49.2 | 5.1 | 2.5 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 188.1 | 194.6 | 194.5 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 9.2 | 6.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 44.2 | 2.7 | 3.4 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2023 | 2024 | |
|---|---|---|---|
| | අප්‍රේල් | මාර්තු | අප්‍රේල් |
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 192.3 | 196.7 | 195.2 |
| මාසික ප්‍රතිශත වෙනස % | (1.4) | (1.9) | (0.8) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 8.0 | 5.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 35.3 | 0.9 | 1.5 |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 171.5 | 177.3 | 177.3 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 6.1 | 4.4 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 27.8 | 3.1 | 3.4 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 206.33 | 235.00 | 230.00 | 230.00 | 215.00 | 250.00 | 240.00 | 240.00 |
| රතු කැකුළු | 163.00 | 178.00 | 179.25 | 180.00 | 165.00 | 200.00 | 190.00 | 190.00 |
| | | | | | | | | |
| බෝංචි | 350.00 | 92.50 | 120.00 | 175.00 | 400.00 | 142.50 | 170.00 | 225.00 |
| ගෝවා | 143.33 | 152.50 | 115.00 | 77.50 | 206.67 | 210.00 | 165.00 | 127.50 |
| කැරට් | 120.00 | 277.50 | 190.00 | 142.50 | 160.00 | 327.50 | 240.00 | 197.50 |
| තක්කාලි | 243.33 | 102.50 | 50.00 | 60.00 | 310.00 | 152.50 | 100.00 | 100.00 |
| වට්ටක්කා | 40.00 | 160.00 | 100.00 | 62.50 | 80.00 | 200.00 | 150.00 | 105.00 |
| පතෝල | 226.67 | 135.00 | 130.00 | 165.00 | 270.00 | 185.00 | 180.00 | 215.00 |
| වම්බටු | 156.67 | 145.00 | 135.00 | 112.50 | 206.67 | 195.00 | 185.00 | 162.50 |
| අමු මිරිස් | 250.00 | 192.50 | 95.00 | 100.00 | 300.00 | 240.00 | 145.00 | 150.00 |
| දෙහි | 300.00 | 327.50 | 900.00 | 850.00 | 350.00 | 385.00 | 1,000.00 | 950.00 |
| | | | | | | | | |
| රතු ළූණු ( දේශීය) | 391.67 | 266.00 | 292.75 | 304.00 | ලැනො. | ලැනො. | 350.00 | 350.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 95.00 | 515.75 | 478.75 | 406.00 | 130.00 | 597.50 | 569.00 | 495.00 |
| අර්තාපල් ( දේශීය) | 285.33 | 313.25 | 261.00 | 248.75 | 320.00 | 380.00 | 300.00 | 300.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,069.67 | 700.00 | 700.00 | 715.75 | 1,180.00 | 850.00 | 850.00 | 850.00 |
| රතු පරිප්පු | 333.00 | 284.50 | 283.00 | 283.00 | 353.67 | 300.00 | 300.00 | 300.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | ලැනො. | 42.50 | 44.25 | 43.25 | ලැනො. | 43.00 | 44.75 | 43.75 |
| පොල් ( ගෙඩියක මිල) | 95.00 | 93.00 | 90.50 | 92.75 | 120.00 | 120.00 | 120.00 | 120.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 192.00 | 229.75 | 234.00 | 237.25 |
| සුදු කැකුළු | 163.00 | 193.00 | 196.00 | 199.00 |
| රතු කැකුළු | 156.67 | 166.00 | 185.00 | 185.50 |
| නාඩු | 183.00 | 198.50 | 203.25 | 207.00 |

ලැනො. - ලැබී නොමැත.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 265.00 | ලැනො. |
| රතු කැකුළු | 186.25 | 185.00 |
| බෝංචි | 141.25 | 176.25 |
| ගෝවා | 88.75 | 82.00 |
| කැරට් | 157.50 | 128.75 |
| තක්කාලි | 40.75 | 48.25 |
| වට්ටක්කා | 75.25 | 50.25 |
| පතෝල | 67.50 | 105.00 |
| වම්බටු | 85.00 | 100.00 |
| අළු කෙසෙල් | 126.25 | 128.75 |
| රතු ළූණු ( දේශීය) | 261.25 | 252.50 |
| රතු ළූණු ( ආනයනික) | 282.50 | 293.33 |
| ලොකු ළූණු ( ආනයනික) | 372.50 | 351.25 |
| අර්තාපල් (දේශීය) | 231.50 | 202.50 |
| අර්තාපල් ( ආනයනික) | 142.25 | 154.25 |
| වියළි මිරිස් ( ආනයනික) | 696.25 | 705.00 |
| පොල් ( ගෙඩියක මිල) | 85.75 | 85.00 |


## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සුදු නාඩු | 220.00 | 220.00 |
| රතු කැකුළු | 175.00 | 193.75 |
| බෝංචි | 300.00 | 360.00 |
| ගෝවා | 340.00 | 270.00 |
| කැරට් | 350.00 | 320.00 |
| තක්කාලි | 150.00 | 160.00 |
| වට්ටක්කා | 185.00 | 160.00 |
| පතෝල | 310.00 | 290.00 |
| වම්බටු | 280.00 | 280.00 |
| අමු මිරිස් | 375.00 | 355.00 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 605.00 | 600.00 |
| අර්තාපල් ( දේශීය) | 426.67 | 390.00 |
| අර්තාපල් ( ආනයනික) | 198.75 | 205.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 965.00 | 800.00 |
| රතු පරිප්පු | 312.50 | 320.00 |
| සුදු සීනි | 273.75 | 260.00 |
| බිත්තර- සුදු ( එකක මිල) | 46.00 | 46.00 |
| පොල් ( ගෙඩියක මිල) | 120.00 | 120.00 |


### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල




## 1.2.5 මාළු වෙළඳපොළ


| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 1,312.50 | 1,350.00 | 850.00 | 850.00 | 1,320.00 | 1,320.00 | 2,060.00 | 2,040.00 |
| බලයා | 766.67 | 900.00 | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. | 1,150.00 | 1,125.00 |
| සාලයා | 462.50 | 407.50 | 437.50 | 390.00 | 542.50 | 505.00 | 520.00 | 546.67 |
| හුරුල්ලා | 725.00 | 600.00 | 725.00 | 592.50 | 910.00 | 765.00 | 1,000.00 | 825.00 |

ලැ.නො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික 2022(අ)(ආ) | 2023 (ආ) | සිව්වන කාර්තුව 2022(අ)(ආ) | 2023 (ආ) |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික | (4.2) | 2.6 | 2.3 | 0.6 |
| කාර්මික | (16.0) | (9.2) | (30.2) | 7.9 |
| සේවා | (2.6) | (0.2) | (4.6) | 2.8 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | (12.4) | 2.8 | (23.6) | 14.9 |
| දළ දේශීය නිෂ්පාදිතය | (7.3) | (2.3) | (12.4) | 4.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | පෙබරවාරි 2023 (අ) | 2024 (අ) | % වෙනස |
|---|---|---|---|
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 18.8 | 20.0 | 6.6 |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 5.7 | 4.5 | (20.8) |
| පොල් (ගෙඩි මිලියන) | 259.1 | 260.7 | 0.6 |

(අ) තාවකාලික





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | පෙබරවාරි 2023 (ආ) | 2024 (ඇ) | % වෙනස |
|---|---|---|---|
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 84.2 | 93.6 | 11.2 |
| ආහාර නිෂ්පාදන | 87.3 | 87.9 | 0.7 |
| ඇඟලුම් නිෂ්පාදන | 79.6 | 85.1 | 6.9 |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 89.8 | 90.0 | 0.2 |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 81.4 | 178.9 | 119.8 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 87.7 | 92.4 | 5.3 |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 74.3 | 85.8 | 15.4 |
| පාන වර්ග | 108.8 | 111.2 | 2.2 |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2023 පෙබ. | 2023 මාර්තු | 2024 පෙබ. | 2024 මාර්තු |
|---|---|---|---|---|
| දර්ශකය | 42.3 | 51.4 | 56.0 | 62.5 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2023 පෙබ. | 2023 මාර්තු | 2024 පෙබ. | 2024 මාර්තු |
|---|---|---|---|---|
| ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය | 45.0 | 56.1 | 53.0 | 67.7 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2023 පෙබ. | 2023 මාර්තු | 2024 පෙබ. | 2024 මාර්තු |
|---|---|---|---|---|
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 37.8 | 45.8 | 57.1 | 55.9 |

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක හරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සැසඳිය හැකිය.







## 1.7 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2023 | 2023 කාර්තු:3 | 2023 කාර්තු:4 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 48.6 | 48.8 | 47.1 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.7 | 4.7 | 4.3 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්(ආ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2023 | 2023 කාර්තු:3 | 2023 කාර්තු:4 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.1 | 25.4 | 26.5 |
| කර්මාන්ත | 25.5 | 25.0 | 25.3 |
| සේවා | 48.4 | 49.6 | 48.2 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2023 පෙබ. | 2024 පෙබ. | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 133.1 | 147.2 | 10.6 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 167.3 | 179.2 | 7.1 |
| කෘෂිකර්මාන්ත | 168.7 | 179.0 | 6.1 |
| කර්මාන්ත | 167.5 | 179.3 | 7.0 |
| සේවා | 164.9 | 179.3 | 8.7 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2023 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2024 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 84.28 | 78.60 | 97.93 | 78.93 | 73.64 | 91.48 |
| පෙබරවාරි | 83.52 | 76.97 | - | 81.48 | 76.53 | 81.33 |
| මාර්තු | 78.93 | 73.05 | 84.05 | 84.57 | 80.23 | 82.76 |
| අප්‍රේල් | 83.09 | 79.10 | 90.49 | 88.99 | 84.47 | |
| මැයි | 76.05 | 72.05 | 86.90 | | | |
| ජූනි | 74.85 | 70.13 | 90.90 | | | |
| ජූලි | 79.90 | 75.52 | 81.29 | | | |
| අගෝස්තු | 85.09 | 81.28 | 81.53 | | | |
| සැප්තැම්බර් | 91.89 | 88.72 | - | | | |
| ඔක්තෝබර් | 89.19 | 86.16 | 88.98 | | | |
| නොවැම්බර් | 82.22 | 77.58 | 99.98 | | | |
| දෙසැම්බර් | 77.53 | 72.36 | 97.62 | | | |

| දිනය | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| 27-04 | 78.07 | 74.50 | - | - |
| 28-04 | 78.19 | 74.71 | - | - |
| 29-04 | - | - | 88.61 | 83.05 |
| 30-04 | - | - | 88.33 | 82.52 |
| 01-05 | - | - | - | - |
| 02-05 | 79.27 | 75.62 | 83.75 | 79.30 |
| 03-05 | 75.29 | 71.59 | 83.85 | 79.14 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2024-04-29 | 2024-04-30 | 2024-05-01 | 2024-05-02 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,340.60 | 2,372.50 | 2,222.30 | 2,631.10 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ) | 49.78 | 48.56 | 40.00 | 50.07 |
| ජල | 18.07 | 14.71 | 10.47 | 14.48 |
| ගල් අඟුරු | 14.57 | 19.53 | 18.69 | 19.46 |
| තෙල් | 13.96 | 10.62 | 6.48 | 11.01 |
| සුළං | 0.17 | 0.73 | 1.45 | 2.03 |
| සූර්ය (තොග) | 2.75 | 2.81 | 2.80 | 2.82 |
| ජෛව ස්කන්ධය | 0.25 | 0.17 | 0.11 | 0.27 |




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය


(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතික | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 15.50 | 8.50 | 8.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 16.50 | 9.50 | 9.50 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 16.49 | 8.63 | 8.63 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 25.82 | 9.90 | 9.61 |
| දින 182 | 25.42 | 10.08 | 9.89 |
| දින 364 | 23.14 | 10.21 | 9.99 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 20.84 | 10.13 | 10.15 |

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (සතිපතා සාමාන්‍යය)




| | 2023 පෙබරවාරි | 2024 ජනවාරි | 2024 පෙබරවාරි |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 6.00 | 0.25 - 13.00 | 0.25 12.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 3.50 - 30.00 | 1.00 - 22.00 | 2.00 - 22.00 |

| | 2023 අප්‍රේල් | 2024 මාර්තු | 2024 අප්‍රේල් |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 15.12 | 10.30 | 9.66 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 19.72 | 13.10 | 12.12 |

| | 2023 මාර්තු | 2024 පෙබරවාරි | 2024 මාර්තු |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 20.48 | 9.52 | 7.61 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 21.07 | 9.77 | 7.73 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 18.29 | 13.74 | 13.43 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 23.70 | 13.44 | 12.96 |

| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2023 මාර්තු | 2024 පෙබරවාරි | 2024 මාර්තු |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 7.75 | 7.75 |

| භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය | වසර 03 මාස 10<br>2024 අප්‍රේල් 29 | වසර 06<br>2024 අප්‍රේල් 29 | වසර 08 මාස 05<br>2024 අප්‍රේල් 29 |
|---|---|---|---|
| පොලී අනුපාතිකය | 10.75 | 11.00 | 9.00 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 11.72 | 12.38 | 12.47 |


**බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව**


| | සතියකට පෙර | මෙම සතිය | | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 11.09 | 10.95 | කාර්ගිල්ස් බැංකුව | 11.61 | 12.77 |
| මහජන බැංකුව | 10.00 | 10.10 | එච්එස්බීසී බැංකුව | 10.72 | 10.86 |
| හැටන් නැෂනල් බැංකුව | 10.00 | 9.91 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 10.42 | 10.17 |
| කොමර්ෂල් බැංකුව | 9.66 | 9.65 | සිටි බැංකුව (අ) | 11.86 | 11.86 |
| සම්පත් බැංකුව | 9.79 | 9.84 | ඩොයිෂ් බැංකුව | 9.49 | 9.91 |
| සෙලාන් බැංකුව | 13.03 | 12.48 | හබීබ් බැංකුව (අ) | 12.63 | 12.63 |
| යූනියන් බැංකුව | 10.16 | 10.10 | ඉන්දියන් බැංකුව | 12.11 | 12.11 |
| පෑන් ඒෂියා බැංකුව | 10.19 | 9.87 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 11.61 | 11.61 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 10.24 | 10.06 | එම්සීබී බැංකුව (අ) | 10.63 | 10.63 |
| ඩීඑෆ්සීසී බැංකුව | 11.69 | 11.73 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 11.42 | 11.12 |
| එන්ඩීබී බැංකුව | 10.47 | 10.23 | පබ්ලික් බැංකුව | 14.03 | 14.00 |
| අමානා බැංකුව | 10.63 | 9.60 | බෑන්ක් ඔෆ් චයිනා | - | - |


(අ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | පෙබරවාරි 2023(අ) | ජනවාරි 2024 | පෙබරවාරි 2024(ආ) | පෙබරවාරි 2023(අ) | ජනවාරි 2024 | පෙබරවාරි 2024(ආ) |
| සංචිත මුදල් | 1,504.7 | 1,488.6 | 1,413.7 | 13.6 | -6.4 | -6.0 |
| පටු මුදල් සැපයුම (M1) | 1,439.3 | 1,606.6 | 1,626.8 | -4.5 | 13.8 | 13.0 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 10,549.9 | 11,449.6 | 11,567.0 | 8.4 | 8.9 | 9.6 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 12,345.8 | 13,114.9 | 13,201.1 | 14.8 | 6.4 | 6.9 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්(ඇ) | -1,434.5 | -400.0 | -320.2 | -12.5 | 74.6 | 77.7 |
| මුදල් අධිකාරීන් | -1,496.0 | -745.1 | -686.1 | -103.7 | 51.6 | 54.1 |
| වාණිජ බැංකු | 61.5 | 345.1 | 365.9 | 111.4 | 1,143.0 | 494.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | -446.9 | -302.1 | -233.8 | -0.5 | 36.7 | 47.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 508.4 | 647.2 | 599.7 | 629.3 | 45.8 | 18.0 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්(ඇ) | 13,780.3 | 13,514.9 | 13,521.4 | 14.5 | -2.7 | -1.9 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 7,470.9 | 8,335.1 | 8,317.0 | 22.5 | 9.5 | 11.3 |
| මහ බැංකුව | 3,155.0 | 2,284.6 | 2,163.6 | 29.2 | -33.0 | -31.4 |
| වාණිජ බැංකු | 4,315.9 | 6,050.5 | 6,153.4 | 18.0 | 44.0 | 42.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,956.6 | 5,850.5 | 5,964.5 | 18.0 | 53.7 | 50.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 359.3 | 200.0 | 188.9 | 17.7 | -49.3 | -47.4 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,714.4 | 747.0 | 733.0 | 38.5 | -57.3 | -57.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,655.8 | 691.1 | 678.5 | 54.1 | -59.1 | -59.0 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 58.6 | 56.0 | 54.5 | -64.1 | -7.4 | -7.1 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,257.9 | 7,314.2 | 7,321.5 | 2.9 | 0.0 | 0.9 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,640.9 | 6,769.0 | 6,791.9 | 1.0 | 1.5 | 2.3 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 617.0 | 545.2 | 529.6 | 30.4 | -15.5 | -14.2 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,662.9 | -2,881.5 | -2,850.1 | -12.9 | -3.6 | -7.0 |












## 2.3 සංචිත මුදල් හා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

| | 2024-04-25 | 2024-05-02 |
|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,451,812.82 | 1,431,875.60 |

| | 2024-04-26 | 2024-05-03 |
|---|---|---|
| සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් | 1,280,073 | 1,264,861 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක්ෂණ මුදල් වෙළඳපොළ | 2024-04-29 | 2024-04-30 | 2024-05-02 | 2024-05-03 |
|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 8.64 | 8.57 | 8.64 | 8.65 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 5.50 | 1.10 | 15.95 | 10.68 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2024-04-29 | 2024-04-30 | 2024-05-02 | 2024-05-03 |
|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 8.82 | 8.91 | 9.08 | 9.03 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 12.25 | 21.62 | 32.42 | 12.26 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2024-04-29 | 2024-04-30 | 2024-05-02 | 2024-05-03 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,676 | 2,676 | 2,676 | 2,656 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,547 | 1,548 | 1,554 | 1,533 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව

## 2.6 විවෘත වෙළඳ කටයුතු

| අයිතමය | 2024 අප්‍රේල් 29 | | 2024 අප්‍රේල් 30 | 2024 මැයි 2 | 2024 මැයි 3 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 25.00 | 40.00 | 10.00 | 20.00 | 10.00 |
| කාල සීමාව (දින ගණන) | 1 | 7 | 2 | 1 | 3 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 9.18 | 44.00 | 15.33 | 14.82 | 10.32 |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 9.18 | 40.00 | 10.00 | 14.82 | 10.00 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 8.51 | 8.58 | 8.65 | 8.51 | 8.65 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 8.75 | 8.85 | 8.75 | 8.70 | 8.75 |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 8.59 | 8.82 | 8.66 | 8.62 | 8.65 |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 179.658 | | 192.144 | 185.578 | 170.906 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 0.250 | | 8.324 | 2.771 | 0.878 |
| | | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **130.228** | | **173.820** | **167.987** | **160.028** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]** | **90.228** | | **133.820** | **127.987** | **120.028** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු

### 2.7.1 ණය කාඩ්පත් [අ]


| | 2023 දෙසැම්බර් | 2024 ජනවාරි | 2024 පෙබරවාරි [ආ] |
|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | 1,917,085 | 1,913,675 | 1,910,096 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 10,768 | 10,623 | 10,547 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,906,317 | 1,903,052 | 1,899,549 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 151,373 | 149,909 | 148,627 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 35,838 | 35,429 | 35,080 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 115,534 | 114,480 | 113,546 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු [ඇ]


| | 2023 දෙසැම්බර් | 2024 ජනවාරි | 2024 පෙබරවාරි [ආ] |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන [ඈ] | 1.3 | 0.0 | 0.0 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) - රු. බිලියන | 0.7 | 0.5 | 0.5 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික
(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඈ) වසරේ මේ දක්වා එකතුව

වාණිජ පත්‍රිකා නිකුතු (සමුච්චිත)





ණය කාඩ්පත් - නොපියවූ ශේෂය




## 2.8 කොටස් වෙළෙඳපොළ

| | 2023-05-04 | 2024-04-26 | 2024-05-03 |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 8,830.36 | 12,201.01 | 12,404.33 |
